කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2015/16

2022 - මැයි

**BCOM E 4015 - උපායමාර්ගික කළමනාකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි : (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

අ. උපායමාර්ගික කළමනාකරණය නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ආ. දැක්ම මෙහෙවර සහ අරමුණු උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලියේ පදනම ලෙස අර්ථ දැක්විය හැක. මෙම සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 06)

ඇ. වෙනස්වන ව්‍යාපාර පරිසරයක් තුල ව්‍යාපාර කටයුතු කිරීමේදී අවස්ථානුකූල ප්‍රවේශයන් අවශ්‍ය වේ.

ප්‍රායෝගික උදාහරණ ගෙනහැර දක්වමින් සාකච්ඡා කරන්න .

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 02**

අ. COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර සඳහා නව අවස්ථා සහ තර්ජන ඇති වී තිබේ. කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් උදාහරණයක් ලෙස ගෙන මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. යම් කර්මාන්තයක තරගකාරී බලවේග අධ්‍යනය කිරීම සඳහා මයිකල් පෝටර් විසින් ඉදිරිපත් කල

පංච බලවේග ආකෘතිය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 03**

අ. පාරිසරික විශ්ලේෂණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? උපායමාර්ගික කළමනාකරණයේදී පාරිසරික විශ්ලේෂණය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ. ප්‍රායෝගික උදාහරණයක් පැහැදිලි කරමින් රෙදි කර්මාන්තයේ ව්‍යාපාරයක් සඳහා බාහිර පාරිසරික සාධක විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 04**

අ. ප්‍රායෝගික උදාහරණ සමඟින් BCG ආකෘතිය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. "උපායක්‍රමික විවිධාංගීකරණය" යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. විවිධාංගීකරණය කෙරු භාණ්ඩ වෙළෙඳපොලෙහි සාර්ථක වන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 05**

අ. උපායමාර්ග ක්‍රියාත්මක කිරීම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

ආ. උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී සංවිධානයක් මුහුණ දෙන ගැටලු මොනවද?

(ලකුණු 06)

ඇ. සමාගමක වෙළෙඳ භාණ්ඩ මිල පහත හෙළීම සාධ්‍ය උපායමාර්ගික මුලපිරීමක් ලෙස දැකිය හැක. මෙම කියමනට ඔබ එකඟ වන්නේද? සුදුසු උදාහරණ සමග පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක - 06**

අ. උපායමාර්ග පාලනය කිරීම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

ආ. උපායමාර්ග ඇගයීමේ ක්‍රියාවලියේ ප්‍රධාන පියවර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. ආයතනික කාර්ය සාධනය මැනීම උපාය මාර්ග ඇගයීමේ සහ පාලනය කිරීමේ වැදගත් කොටසකි. සාකච්ඡා කරන්න

(ලකුණු 10)
(මුළු ලකුණු 20)